৷ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2114/50 – 2019 මාර්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා – 2019.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, හසලක ජලසම්පාදන ව්‍යාපෘතියේ , වරාගොල්ල භූගත ජල ගබඩා ටැංකියේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 05 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1448

1A – G 29655 – 39 (2019/03)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 931, වේරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දික්ගොම්මන, 46 ඇළ ගමේ පිහිටි, ''46 ඇල, අංක 05 ඉඩම'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 11 ක් පමණ වන ඉඩම් කොටස් දෙක.

කැබලි අක්ෂර : ඒ
ඉඩමේ නම : 46 ඇල, අංක 05 ඉඩම
මායිම් :
*උතුරට* : එම්. ජී. ඩිංගිරි බණ්ඩා හිමිකම් කියන ඉඩම හා නිවස
*නැගෙනහිරට* : පොදු මාර්ගය හා වාරි ඇල
*දකුණට* : කම්බි වැට හා එම්. ජී. ලීලාවතී හිමිකම් කියන ඉඩම
*බටහිරට* : ආරක්ෂිත අලිවැට

කැබලි අක්ෂර : බී
ඉඩමේ නම : 46 ඇල, අංක 05 ඉඩම
මායිම් :
*උතුරට* : එම්. ජී. ඩිංගිරි බණ්ඩා හිමිකම් කියන ඉඩම
*නැගෙනහිරට* : එම්. ජී. ඩිංගිරි බණ්ඩා හිමිකම් කියන ඉඩම සහ නිවස
*දකුණට* : එම්. ජී. ඩිංගිරි බණ්ඩා හිමිකම් කියන ඉඩම සහ එම්. ජී. ලීලාවතී හිමිකම් කියන ඉඩම
*බටහිරට* : ආරක්ෂිත අලිවැට

*01. ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්:*

1. උරුලැවත්තේ ධම්මරක්ඛිත හිමි,
විහාරාධිපතීන් වහන්සේ,
මහියංගන රජ මහා විහාරය,
මහියංගනය.

2. මහාභාරකාර තුමා,
මහාභාරකාර දෙපාර්තමේන්තුව,
බුලර්ස් පාර,
කොළඹ 07.

3. එම්. ජී. ඩිංගිරිබණ්ඩා මහතා,
අංක 5, 46 ඇල,
වේරගම,
වේරගන්තොට.

සහ
තවත් අය.

03 – 1425

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම (2 වන අධිකාරය වූ ) අර්ථනිරූපන ආඥාපනතේ 18 වන වගන්ති සමග කියවිය යුතු 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගලගෙදර මාවතගම ජලසම්පාදන ව්‍යාපෘතියේ ස්ථානභාර නිලධාරි කාර්යාලය ඉදිකිරීම පිණිස ඉඩම්

කොටසක් අවශ්‍යව ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීමට අදාළ අංක 2069/21 හා 2018 මැයි මස 02 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මේ නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.
5/2/2/1370

උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 677, මාවතගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාවතගම ගමේ පිහිටි ඩෙන්වර්වත්ත නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 02ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : ප්‍රාදේශීය ලේකම් සතු රජයේ ඉඩම.
*නැගෙනහිරට* : ප්‍රාදේශීය ලේකම් සතු රජයේ ඉඩම.
*දකුණට* : ඒ 10 මහනුවර කුරුණෑගල ප්‍රධාන මාර්ගය.
*බටහිරට* : කොට්ඨාස අධ්‍යාපන කලාප කාර්යාලය සඳහා වෙන් කරන ලද ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*

1. ප්‍රාදේශීය ලේකම්, මාවතගම.

03 - 1426

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.